හද විදුවන මතක සුවඳ

26

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට

1993 මැයි 24 දාතමින් යුතුව චෝදනාවලට පිළිතුරු සපයන සී. අයි. ප්‍රනාන්දු සහෝදරයා සිය ලිපිය යොමු කරන්නේ චෝදනා පත්‍රයේ "ප්‍රධාන ලේකම්" ලෙස අත්සන් කර ඇති සෝමවංස අමරසිංහ සහෝදරයාට නොව වැඩ බලන ලේකම් අමරසිංහ සහෝදරයාටය.

පුද්ගල චරිත වටා කේන්ද්‍ර ගතවන ධනේෂ්වර හා සුළු ධනේෂ්වර පක්ෂ සමඟ සංසන්දනය කොට බැලූ කල්හි සාපේක්ෂව හෝ දේශපාලන දැනුමක් ඇත්තේ මාක්ස්වාදී, කොමියුනිස්ට් පක්ෂවල සාමාජිකයන්ට යයි පිළිගත යුත්තකි. මෙම පක්ෂවල අභ්‍යන්තර ගැටුම් සිද්ධවන අවස්ථාවලදී පක්ෂයට හෝ නායකයාට වැරදීමට විදියක් නැතැයි පක්ෂ සාමාජිකයන් දැඩිව විශ්වාස කිරීම සාමාන්‍ය දෙයකි. පිළිවෙතකි.

පක්ෂය කියන්නේ කුමක්ද ? මාක්ස්වාදී පක්ෂයක සාමාජිකයෙකුගෙන් යමෙකු මෙසේ විමසුවහොත් නිසැකයෙන්ම ඔහුගේ පිළිතුර වනු ඇත්තේ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ බවය. එහෙත් යථාර්ථය නම් පක්ෂය යනු නායක මණ්ඩලයක් හෝ අනුහස් සහිත එක් නායකයෙකි. ලංකාවේ රෝහණ විජේවීර කළ හරියත්, රුසියාවේ ගොර්බෂොප් කළ හරියත්, කියුබාවේ පිදෙල් කස්ත්‍රෝ කරන හරියත් උදාහරණයට ගත්විට මේ සත්‍ය පසක් වෙයි.

නායකයා යනු කවරෙක්ද? ඔහුද මිනිස් හැඟීම් ඉක්මවා නොගිය පෘතග්ජන මනුෂ්‍යයෙකි. ඔහුට ද වැරදීම් වීමට ඉඩ තිබේ. ඔහු සර්ව නිර්දෝෂී නොවේ.

අද දවසේ යමෙකු විශ්වාස කරන, පිළිපදින ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළ (දේශපාලන) වෙනස් නොවන සුලු ස්ථිර එකක්ද? එයද ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙයි. එය මැනවින් සාක්ෂාත් වන්නේ කාලයට ඉඩ දී ඉතිහාසයේ විනිශ්චයට බඳුන් වූ විටදී ය.

ධනපති සභාග රජයන්හි කොටස්කරුවන් වී පාර්ලිමේන්තුවෙන් සමාජවාදය උදාකරන්නට ගිය සමසමාජ " කොමියුනිස්ට් පක්ෂ දෙක දෙස අදින් වසර විසිපහකට පෙර ජ.වි.පෙ. සාමාජිකයන් බැලුවේ කෙබඳු ඇසකින්ද ? කථා කළේ කෙතරම් උපහාසයකින්ද ? පන්ති පහේ දෙවැනි පන්තිය වූ "ශ්‍රී ලංකාවේ වමේ ව්‍යාපාරය" පන්තිය අද එදා කළ අකාරයටම කළ හැකිද ? පැරණි වම මෙන් සාදාචාරාත්මකව පිරිහී නැතත්, අංගය කළයුතු ගුණාංග හා ප්‍රතිපත්ති රැක ගනිමින් වුණත් ජ.වි.පෙ. අද යන්නේ පැරණි වමද ගිය පාර්ලිමේනතු මාවත ඔස්සේ නොවේද ? ධනපති ප්‍රතිපත්ති සහිත ශ්‍රී.ල.නි.ප.ය සමඟ පෙරමුණු වලට යාමට ජ.වි.පෙ.ට සිදු වී තිබෙනවා නොවේද ? ආගමික වතාවත් වලදී ජ.වි.පෙ. සාමාජිකයන් පන්සිල් නොගන්නා කාලයක් තිබිණ. හෙවත් විඥානවාදී යයි තීරණය කොට ආමිස පුජාවන් ප්‍රතික්ෂේප කර පිටු දැක්විණි. අද ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්වරයා අටපිරිකර රැගෙන මහානායක හිමිවරුන් බැහැ දැකීමට නොයත්ද ? විඥානවාදී වුවද වැඳුම් පිදුම් හා ආගම් භක්තිය අපේ ජනතාවගේ සංස්කෘතික උරුමයක් බව, කිසිවෙකුට එයට පිටුපෑ නොහැකි බව ජ.වි.පෙ. අද තේරුම් ගෙන සිටිනවා නොවේද ?

සෝමවංස අමරසිංහ සහෝදරයා සහ ලන්ඩන් ශාඛාව අතර අර්බුදය ඇති වී, ලන්ඩන් ශාඛාව විසුරුවා හැර එම සහෝදරවරුන් පක්ෂයෙන් නෙරපා දමා දැන් වසර පහළොවකට ආසන්න ය. ජ.වි.පෙ. නායකයා සේම එම සොයුරන් ද වයස හැට හැත්තෑ ගණන්වලට ළං වෙමින් පා නගන්නේ ජීවිතයේ සැඳෑ සමයට ය.

පක්ෂය යනු නායකයා යන්නට සෝමවංශ " ලන්ඩන් ශාඛා අර්බුදය හොඳම නිදර්ශනයකි. ලංකාවේ සිටින ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලයට ලන්ඩන් ශාඛා සාමාජිකයන්ගේ වැර වාර්තා කළේ නායකයා ය. එම නිගමන හා චෝදනා සියල්ලම පක්ෂ නායකයාගේ ය. මේ චෝදනාවල සත්‍ය " අසත්‍යතාවය සොයා බැලීමට ලංකාවේ සිටින ජ.වි.පෙ. නායකයෙකු ලන්ඩනයට හෝ ප්‍රංශයට පැමිණියේද ? නැත. ලන්ඩන් ශාඛාව විසුරුවා හැර ඔවුන් පක්ෂයෙන් නෙරපා දැමිය යුතු යයි නිර්දේශ කරන්නේද නායකයා ය. එසේ නම් පක්ෂය යනු නායකයා යන්න අසත්‍යක්ද ? පක්ෂයට හෝ නායකයාට වැරදීමක් විය නොහැකිද ? මගේ පුද්ගලික මතය නම් එසේ විය හැකි බවය. ඇතැම්විට තනි පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු ඉදිරිපත් කරන මතවාදයක් හෝ හඬක් යටපත්ය යන්නේ එය අසත්‍ය හෝ නිවැරදි නොවන නිසාම නොව එය විශාල හඬක් හා තරග වැදිය නොහැකි විශාල හඬක් හටපත් කළ නොහැකි තනි හඬක් වන නිසාය. නිමාවෙන් ඉහළ සපත්තු හදන කුඩා වෙළඳ හලක් මහා පරිමාණ සපත්තු කම්හලක් ඉදිරියේ බංකොලොත්ව වැසී යන්නාක් සේය.

සෝමවංශ " ලන්ඩන් ශාඛා අර්බුදය, ජ.වි.පෙ. ලංකාවේ සාමාජික හිතවතුන්ට එතරම් දැනුණ දෙයක් හෝ බලපෑ දෙයක් නොවුවත් විදේශ ගතවී සිටි පක්ෂයේ සාමාජික හිතවතුන්ට, විශේෂයෙන් යුරෝපා රටවල සිටින අයට තදින් දැනීගිය දෙයකි.

මුලින් මුලින් අභ්‍යන්තර ආරංචි මාර්ග ඔස්සේ හා දුරකථන ඔස්සේ පැමිණි මෙම පුවත් පසුව ප්‍රංශයේ පළකරන (රෝනියෝ මුද්‍රණය) ජ.වි. පෙරමුණේ ජාත්‍යන්තර අංශයේ පුවත්පත සේ හඳුන්වන "අරුණෝදය" මගින් ද ජ.වි.පෙ. මහා බ්‍රිතාන්‍ය ශාඛාවේ පුවත්පත වූ "ගිනිපුපුර" මගින් ද හෙළිදරව් වන්නට විය. පසුව ලංකාවේ පුවත්පත හරහා ද, බී. බී. සී යේ සිංහල සේවය හරහා ද ප්‍රසිද්ධියට පත් වූ මෙම අර්බුදයේ අවසාන අදියර වන්නේ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් වන සොමවංස අමරසිංහ සහෝදරයා ලන්ඩන් ශාඛාව විසිරුවා දැමීමත්, ලන්ඩන් ශාඛාවේ සාමාජිකයන් එම චෝදනාවලට සැපයූ ලිඛිත පිළිතුරු පිටු 32 ක පොතක් වශයෙන් මුද්‍රණය කර (රොනියෝ මුද්‍රණය) ලංකාවේ සහ විදේශගත ජ.වි.පෙ. සාමාජිකයන් අතර බෙදා හැරීමත් ය.

අරුණෝදය, ගිනි පුපුර හා මුද්‍රිත පොතේ කරුණු ඇසුරෙන් මගේ මතය හා නිගමනය එළිදැක්වීමට වඩා "ජ.වි.පෙ. සැඟවුණ ඉතිහාසයෙන් බිඳක්" යනුවෙන් නම් කරන ලද මෙම කෘතියට සර්ව සාධාරණයක් ඉටුවෙන්නේ ඉතා අසීරු කාර්යයක් වුවද ඉහත සඳහන් ප්‍රකාශන තුනේ අඩංගු කරුණු තෝරා බේරා සංක්ෂිප්තව හෝ ඉදිරිපත් කොට විනිශ්චයකට එළඹීමේ අයිතිය හා ඉඩ ප්‍රස්ථාව පාඨකයාටම ලබා දීමෙනි. එහි සඳහන් ඇතැම් ඉතිහාස කරුණු ලංකාවේ නොව විදේශවල සිටින්නා වූ ජ.වි.පෙ. වර්තමාන සාමාජිකයන් පවා නොදන්නා බැවින් එය ඔවුන්ටද වැදගත් වෙයි. ඇතැම් දේ සම්බන්ධයෙන් අවධාරණාත්මකව පැහැදිලි කිරීමකට පමණක් මට ඉඩ දෙන්න.

1993 මාර්තු මස 31 දාතමින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් ජ.වි.පෙ. ලන්ඩන් ශාඛාවේ සී. අයි. ප්‍රනාන්දු සහෝදරයාට, රංජිත් මෙන්ඩිස් සහෝදරයාට සහ පෝල් පීරිස් සහෝදරයාට ලිපි තුනක් යවන සෝමවංශ අමරසිංහ සහෝදරයා ඉහත සඳහන් දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි ඔවුන් තිදෙනාගේ පක්ෂ සාමාජිකත්වය අත්හිට වූ බව දැනුම් දෙයි.

මෙම ලිපිය ලැබී සති දෙකක් ඇතුළත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන බවද 1993 මැයි 31 වන දිනට නිදහසට කරුණු ඉදිරිපත් කළයුතු බවද, එසේ නොකරන්නේ නම් වැරදිකරුවන් සේ සලකා ජ.වි.පෙ. න් නෙරපා හරින බවද එහි සඳහන් ය. නිදහසට කරුණු දැක්වීම සඳහා ලබා දී ඇත්තේ ඕස්ට්‍රේලියාවේ ලිපිනයකි.

1993 අප්‍රේල් මස 10 දින එම සහෝදරවරුන්ට ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ලෙස චෝදනා පත්‍ර ඉදිරිපත් කරන අමරසිංහ සහෝදරයා සී. අයි. ප්‍රනාන්දු සහෝදරයාට චෝදනා 10 ක්ද රංජිත් මෙන්ඩිස් සහෝදරයාට චෝදනා 14 ක්ද, පෝල් පීරිස් සහෝදරයාට චෝදනා 19 ක්ද වශයෙන් ඉදිරිපත් කරන්නේ තමාගේම අත් අකුරිනි.

ලන්ඩන් ශාඛාවේ සොයුරන් තමන්ට එවන ලද චෝදනා පත්‍ර ද, එයට තමන් විසින් සපයන ලද පිළිතුරු ද ඇතුළත් කොට පිටු 32ක පොතක් (ඒ 4 ප්‍රමාණයේ) පක්ෂයේ සාමාජික හිතවතුන් අතර බෙදා හරින්නේ 1993 ජුනි මස 31 දාතමින් යුතුව ය.

එහිදී ඔවුන් නගන ප්‍රබල තර්ක මෙසේය.

අමරසිංහ සහෝදරයා 1993 මාර්තු 31 අප වෙත ඒවා ඇති ලියුමේ සඳහන් කොට ඇත්තේ පක්ෂ සාමාජිකත්වය අත්හිටවූ බව හා 1993 මැයි මස 31 දිනට පෙර නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙසය. එම ලිපියේ බ්‍රිතාන්‍ය ශාඛාව විසුරුවා හැරිය බවක් සඳහන් නොවෙයි. එහෙත් බ්‍රිතාන්‍ය ශාඛාව විසුරුවා හැරිය බවට 1993 අප්‍රේල් මස 10 වැනිදා අරුණෝදය පත්‍රයට ලිවීමත්, මැයි මස 8 වෙනිදා ලියා පදිංචි තැපෑලෙන් යවන ලද ලිපියකින් ඒ පුවත ඊගර්ගය යට දැන්වීමත් ගැන සලකා බලන විට පැහැදිලි වන්නේ සෝමවංස අමරසිංහ සහෝදරයා ප්‍රථමයෙන් බ්‍රිතාන්‍ය ශාඛාව විසුරුවා හැරීමට තීරණය කොට පසුව මෙවැනි අසත්‍ය හා ව්‍යාජ චෝදනා ඉදිරිපත් කළ බවයි. මෙය " ස්ටාලින්" සියලුම බලතල ඇති යුගයේවත් නොකළ තරමේ දෙයකි.

ජ.වි.පෙ. බ්‍රිතාන්‍ය ශාඛාවේ සභාපතිවරයා වූ සී. අයි. ප්‍රනාන්දු සහෝදරයාට ඉදිරිපත් කරඇති චෝදනා පත්‍රයේ ඇති චෝදනා 10 න් ප්‍රධාන චෝදනා කිහිපයක් මෙසේය.

1. ප්‍රංශයේ දේශපාලන රැකවරණ ලබාගැනීම සඳහා ජ.වි.පෙ. නොවන ශ්‍රී ලාංකිකයන්ට, පක්ෂයට අයත් පුද්ගලයන් බවට සහතික කර ලිපි සැපයීම.
2 කතරගම ප්‍රේමවතී මනම්පේරි සහෝදරියගේ පවුලේ කෙනෙකුයයි සහතික කර ලිපියක් ලබාදීම.
3 පක්ෂයට සම්බන්ධ නැති මහත්මියකට ලිපියක් ලබාදීම. ඇය ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවා වනිතා ඒකකයේ සාමාජිකාවකි. ඇගේ සැමියා පක්ෂයේ විරුද්ධවාදියෙකි.

4. වැනි චෝදනාව " ජනතාවගේත් අප පක්ෂයේත් ද්‍රෝහියෙකුවුත් දොස්තර සුභාෂ් චන්ද්‍ර ප්‍රනාන්දු ලන්ඩනයට පැමිණි අවස්ථාවේ මාසයකට අධික කාලයක් ඔබගේ නිවසේ නවාතැන් දීම ලන්ඩන් ශාඛාවේ සමහරු ඔහුට දේශපාලන රැකවරණ ලබා ගැනීමට උදව් කරන විට එය විරුද්ධ නොවීම.

10 වැනි චෝදනාව " රෝහණ විජේවීර, උපතිස්ස ගමනායක සොයුරන් ඇතුළු අනෙක් සහෝදර සහෝදරියන් මරා දැමීම ගැන ජාත්‍යන්තර අධිකරණයකදී ප්‍රේමදාස පාලනය අභියෝගයට ලක්කිරීමට කිසිවක් නොකිරීම.

1993 මැයි 24 දාතමින් යුතුව චෝදනාවලට පිළිතුරු සපයන සී. අයි. ප්‍රනාන්දු සහෝදරයා සිය ලිපිය යොමු කරන්නේ චෝදනා පත්‍රයේ "ප්‍රධාන ලේකම්" ලෙස අත්සන් කර ඇති සෝමවංස අමරසිංහ සහෝදරයාට නොව වැඩ බලන ලේකම් අමරසිංහ සහෝදරයාටය. එසේම එම ලිපිය ලියා පදිංචි තැපෑලෙන් යවන්නේ අමරසිංහ සහෝදරයා දන්වා ඇති පරිදි THE SECRETARY (J.V.P) P.O. BOX 194, CORNEGIE, VICTORIA 3163, AUSTRALIA යන ලිපිනයට නොව, B.P. 485775528" PARIS, FRANCE යන ලිපිනයට ය.

25 වන පිටට